**ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව **2019** මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කළ ආදායම් වෙනත් ලැබීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුව තිබුණත්, එසේ එකතු කළ රු.2,799,938 ක ලැබීම්වලින් රු.114,754 ක ලැබීම් පමණක් දක්වා තිබුණි. ඒ අනුව රු.2,685,184 ක ලැබීම් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රු.79,626 ක්වූ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේද, රු.2,167,240 ක්වූ වැන්දඹු අනත්දරු දායක මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වැටුප් වේතන හා අනෙකුත් ප්‍රතිලාභ යටතේද, රු.553,772 ක්වූ ණය පොලී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේද,ඇතුළත්ව ඇත. |
| (ආ) | ඉහත සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් සංඛ්‍යා පදනම් කර ගත යුතුව තිබුණි. ඒ අනුව කටයුතු නොකිරීම නිසා භාණ්ඩාගාර අවසාන ගිණුම් වාර්තාව සමඟ පහත සඳහන් පරිදි වෙනස් වූ අවස්ථාවන් නිරීක්ෂණය විය.<br><br>(i) තැන්පත් ලැබීම් රු.28,473 ක් වැඩියෙන් දැක්වීම<br><br>(ii) තැන්පත් ගෙවීම් රු.7,800 ක් වැඩියෙන් දක්වා තිබීම<br><br>(iii) අත්තිකාරම් ලැබීම් රු.318,150 ක් අඩුවෙන් දක්වා තිබීම.<br><br>(iv) අත්තිකාරම් ගෙවීම් රු.489,670 ක් අඩුවෙන් දක්වා තිබීම.<br><br>(v) පුනරාවර්තන හා මූලධන වියදම රු.1,745,000,000 ක් වැඩියෙන් දක්වා තිබීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | - |

(vi) ඉහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.1,747,492,991 ක් අඩුවෙන් දක්වා තිබීම.

(ඇ) විගණනයට ඉදිරිපත් කර තිබුණු අක් මුදල් ගැලැපුම් ගිණුමේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව විසින් වෙනත් ශීර්ෂ වෙනුවෙන් වියදම් කර තිබුණු රු.1,745,477,389 ක් අක් මුදල් ගැලැපුම් ගිණුමේ දක්වා නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අතර වූ පහත සඳහන් වෙනස්කම් ගලපා නොතිබුණි.

- තැන්පත් ලැබීම් රු.28,398 ක්
- තැන්පත් ගෙවීම් රු.7,800 ක්

**(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) හා 38(2) යන උප වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලන පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එම ප්‍රකාශ 2019 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) හා 38(2) උප වන්තිවල සඳහන් අවශ්‍යතාවයන් ඉටු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 04 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 45 ක සිට සියයට 76 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවිම. | යන්ත්‍ර උපකරණ මිලදී ගැනීමට හා නවීකරණය කිරීමට අවශ්‍යතාවයක් පැන නොනැගීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොවීම, ආදී හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

**මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හැර නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.1,002,305 ක ණය ශේෂ හිඟ හිටව පැවතුණි. එම ණය ශේෂවලින් 2019 මැයි 31 දින වන විටත් තව දුරටත් අයවිය යුතු රු.825,529 ක ණය ශේෂ පැවතුණි. එම ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මියගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු176,776. ක ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අය කර ඇත. ඉතිරි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් රු.526,379 ක ණය ශේෂ හිඟ හිටව පැවතුණි. ඉන් 2019 මැයි 05 දින රු.149,530 ක් අය කරගෙන | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.149,530 ක් ණය |

| | | | |
|---|---|---|---|
| | තිබුණත්, තවදුරටත් රු.376,849 ක ණය ශේෂ අයවිය යුතුව පැවැතිණි. 2004 ඔක්තෝබර් 04 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍ර ලේඛය ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරු වී මාස 03 ක් ඇතුළත එම ණය ශේෂ අයකර ගත යුතුව තිබුණත්, එසේ කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | | ශේෂය නිරවුල් කිරීම සඳහා ලැබී ඇත. ඉතිරි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | අත්තිකාරම් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර රු.215,169 ක වෙනසක් අනාවරණය විය. | මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ පොත් භාණ්ඩාගාරයේ පොත් සමඟ සැසඳීම සිදු කළ යුතුය. | වසර කිහිපයක් සිට පැවත එන මෙම වෙනස හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව විගණනය කිරීම සඳහා සමූපකාර සමිතිවලින් මූල්‍ය ප්‍රකාශන 94 ක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. සමිති විසින් මූල්‍ය ප්‍රකාශන 67 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. ඉතිරි මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එම මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද අවසාන විගණන වාර්තා 70 ක් මුදා හැරීමට ඉලක්ක කර තිබුණත්, | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | සමූපකාර සමිති සංගම්වල ප්‍රමාණවත් දැනුමක් සහිත කාර්යමණ්ඩල ඌනතාවයක් නිසා ගිණුම් ඉදිරිපත් වීම ප්‍රමාදවීමට හේතුව ලෙස දැකිය හැකි අතර ඒ සඳහා 2018 වර්ෂයේදී විධිමත් පුහුණු වැඩ සටහනක් සැලසුම් කලද එය ක්‍රියාත්මක නොවීම ගිණුම් ප්‍රමාදය සඳහා බලපෑමක් වී ඇති බව නිරීක්ෂණය කරමි. |

| | | | |
|---|---|---|---|
| | වාර්තා 45 ක් පමණක් මුදා හැර තිබුණි. | | |
| (ආ) | 1972 අංක 5 දරන සමූපකාර සමිති සංශෝධන පනතේ 43(අ)(2) වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත සමූපකාර සමිතිවල ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ වාර්ෂික ප්‍රකාශ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට සමූපකාර සමිති 24 ක් විසින් මූල්‍ය ප්‍රකාශ 34 ක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | 2018 දෙසැම්බර් 31 දින වන විට සමූපකාර 24 කින් මූල්‍ය ප්‍රකාශන 34 ක් ලෙස සංශෝධනය විය යුතු බව පිළිගනිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කර තිබුණු අක්‍රීය සමූපකාර සමිති සඳහා 50(අ) වාර්තාව නිකුත් කිරීම, ලියාපදිංචිය අවලංගු කිරීම් පළ කිරීම, ඈවර කරුවන් පත්කිරීම් සහ ඈවර කටයුතු ක්‍රියාත්මක කිරීම වැනි කටයුතු 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලබා කර ගැනීමට කටයුතු කළ යුතුය. | අක්‍රිය සමූපකාර සමිති සඳහා 50(අ) වාර්තා ඉදිරිපත් කිරීම සමිති අංශයෙන් සිදුවිය යුතුව ඇත. සමිති අංශයෙන් කිසිදු වාර්තාවන් ලැබී නොමැති බැවින් ඉදිරි අනුගාමී ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැත. |

**3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | --------------------------- - |
| (අ) | 2013 අප්‍රේල් 26 දිනැති අංක අමප/13/0409/540/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමූපකාර ග්‍රාමීය බැංකු, ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, සණස සංගම් සහ වෙනත් මූල්‍ය සමූපකාර සමිතිවල කටයුතු නියාමනය කිරීම පිණිස විශේෂිත නියාමන ඒකකයක් පිහිටුවිය යුතු බවට තීරණය කර තිබුණි. ඒ අනුව | නියාමන කටයුතු සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කළ යුතුය . | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු විසින් මූල්‍ය සේවා නියාමනය සඳහා වන ප්‍රඥප්ති කෙටුම්පත් බලාත්මක නොකිරීම නිසා මෙම නියාමන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| | පිහිටුවනු ලැබූ නියාමන ඒකකය සඳහා 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.20,997,850 ක් වැය කර තිබුණි. එසේ වුවද එම ඒකකය ආරම්භ කර වසර 06 ක කාලයක් ගත වී තිබුණත්, එම නියාමන කටයුතු සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ආ) | මූල්‍ය සේවා සමිති සම්බන්ධ තොරතුරු ඇතුළත් දත්ත බැංකුවක් ආරම්භ කිරීමට හා නියමිත අකෘතියකට අනුව එම සමිතිවල මූලික තොරතුරු රැස්කිරිම හා යාවත්කාලින කිරිම පිළිබඳව නියාමන කමිටු රැස්වීම්වලදී යෝජනා සම්මත කර ගෙන තිබුණි. ග්‍රාමීය බැංකු හා අනෙකුත් මූල්‍ය සේවා සමුපකාර සමිති සඳහා නියාමන ක්‍රමවේද හඳුන්වා දීම හා මූලික දත්ත රැස් කිරීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණි. මේ සඳහා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.5,920,186 ක් වැය කර තිබුණි. එසේ වුවද, දිවයින පුරා ස්ථාපිතව ඇති ග්‍රාමීය බැංකු හා අනෙකුත් මූල්‍ය සේවා සමුපකාර සමිති සම්බන්ධව දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුළ දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. | මේ සඳහා පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවලින් ඉල්ලුම් කළ සමිති තොරතුරු නොලැබීම නිසා දත්ත බැංකුව නිර්මාණය කිරීමට නොහැකි විය. |
| (ඇ) | ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රය හැර අනෙකුත් මූල්‍ය සේවා සමිති සහ සණස සමිති සඳහා දෙපාර්තමේන්තුවේ නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක කර නොතිබුණි . | අනෙකුත් මූල්‍ය සේවා සමිති සහ සණස සමිති සඳහාද නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක විය යුතුය . | අනෙකුත් මූල්‍ය සේවා සමිති සහ සණස සමිති සඳහාද නියාමනය සඳහා අවධානය යොමු වී ඇත. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2010 හා 2011 යන වර්ෂයන්හිදී දෙපාර්තමේන්තු චක්‍රීය අරමුදලින් රු.මිලියන 632.5 ක් පළාත් පාරිභෝගික සමූපකාර සංගම් 9 ක්, සමූපකාර අලෙවි සංගමය, සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය හා සමූපකාර තොග වෙළඳ සංස්ථාව වෙත අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය මුදල් ලෙස ලබාදී තිබුණි. ණය ලබාදී වසර 09 ක් ගතවී තිබුණද ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් ගෙවා නොතිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 224.05 ක් අයවීමට පැවතුනි. ණය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට එම සමිති අධ්‍යක්ෂ මණ්ඩල වෙත ලිඛිතව දන්වා ලිපි යැවීමටත් සියළු පාරිභෝගික සංගම් හා පළාත් කොමසාරිස්වරුන් දැනුවත් කර කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 ඔක්තෝබර් 16 දින පැවැති ජීවන වියදම් කමිටුවේ නිර්දේශ මත ඌව පළාතේ ගොවීන්ගේ අර්තාපල් කිලෝවක් රු. 92 ක සහතික මිලකට මිලදී ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 150 ක් වාරික 02 කින් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය වෙත ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේදී තීරණය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 75 ක් මාස 06 ක කාලයක් ඇතුළත නැවත පියවීමට යටත්ව සංගමය වෙත ලබා දීමට 2018 නොවැම්බර් 23 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණයකින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ | ණය මුදල් ගෙවීම පැහැර හැරි අවස්ථාවක හෝ ප්‍රමාද කළ අවස්ථාවක අදාළ මුදල් අයකර ගැනීමට ඇප බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය . | අල ගොවීන් වෙත මුදල් ලබාදීම කඩිනමින් සිදු කළ යුතු වීමෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමට කටයුතු කළ නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| | 001-1-2-0-1409 දරන වැය විෂය යටතේ දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු මුදලින් රු.මිලියන 75 ක් 2018 නොවැම්බර් 29 දින එම සංගමයට ලබා දී තිබුණි. සංගමය විසින් එම මුදල් ගෙවීම පැහැර හැරි අවස්ථාවක හෝ ප්‍රමාද කළ අවස්ථාවක අදාළ මුදල් අයකර ගැනීමට ඇප බැඳුම්කරයක් ලබා ගැනීමට දෙපාර්මේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සමුපකාර සංගමය විසින් මිලදී ගන්නා ලද අර්තාපල් ගබඩා 03 ක ගබඩාගත කර තිබුණි. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩා දෙකක ගබඩා කර තිබුණු රු.85,823,850 ක් වටිනා අර්තාපල් කිලෝ 932,868 ක් නරක් වී තිබුණි. මේ හේතුවෙන් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් වේයන්ගොඩ අංක 08 ගබඩාවට අලාභහානි වී තිබුණි. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝබර් 19 දිනැති අංක MIC/116/COL/Letters දරන ලිපියෙන් සංගමය වෙත ලබාදෙනු ලබන මුදල් එම ආයතනයෙන් නැවත ලබාගෙන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයට පියවිය යුතු බවත්, මේ සම්බන්ධයෙන් වූ සියළුම කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය දෙපාර්තමේන්තුව වෙත පවරන බවත් දන්වා තිබුණි. එසේ වුවත් සංගමයට අර්තාපල් අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම නිසා අර්තාපල් නරක්වී තිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කළ යුතුය. | සංගමය මඟින් ඍජුව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය සිදු කර ඇති අතර අදාල වාර්තා පදනම් කරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |